## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පහත සදහන් රටවල් සදහා ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් ලබාගැනීමේ(IDD) පහසුකම **2005** නොවැම්බර් **01** වැනි දින සිට **2006** ජනවාරි **31** වැනි දින දක්වා වූ මාස **03** ක් සදහා තාවකාලිකව නවත්වන ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන් ඉල්ලා සිටින ලද බව පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටියි.

සොලමන්ස් දූපත්, වැනුආටා, කුක් දූපත්, වොලිස්, ෆුත්ටානා දූපත්, පැපුවා නිව්ගිනියා, නාරු, ටුවාලු, ටෝකේලාඋ, බටහිර සැමොආ, කිරිබාටි, නිව් එස්ටෝනියා, මෙම රටවල් වේ. විශේෂ පරිමාණයේ සේවාවන්ට අදාල වංචනික ක්‍රියා හේතුවෙන් (Modem Hijacking), අනවසරයෙන් ඉහල මිල ගනන් යටතේ අන්තර්ජාලයට සම්බන්ධවීම වැනි මෙකී ක්‍රියාවලින් පාරිභෝගිකයන් ආරක්‍ෂා කර ගැනීම සදහා මෙය සිදු කෙරේ,

එමෙන්ම ඔබ විද්‍යුත් තැපැල් පහසුකම් භාවිතා කිරීමේදී හෝ අන්තර්ජාලයේ සැරිසැරීමේදී රහස්‍ය සංකේත අංක සහිතව ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් ලබාගැනීමේ (IDD) පහසුකම අවහිර කිරීමට උපදෙස් ලබාදෙනු ලැබේ.

ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් ලබාගැනීමේ (IDD) පහසුකම භාවිතා කිරීම සදහා ගාස්තු වශයෙන් පාරිභෝගිකයන්ගේ දුරකථන බිල්පත්වල ඉහල ගාස්තු සටහන්වීම සම්බන්ධයෙන් ඔවුන් විසින් සැලකිය යුතු පැමිණිලි සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත සදහන් රටවල් සදහා ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් ලබාගැනීමේ(IDD) පහසුකම තාවකාලිකව නැවැත්වීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පාරිභෝගිකයන්ට සිදුවන අපහසුතාවයන් පිලිබදව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බෙහෙවින් කණගාටුවේ. මෙය මහජනතාවගේ යහපත සදහා සිදුකරන්නක් බව කරුණාවෙන් දන්වා සිටිමු.

එමෙන්ම එකී රටවලට ඇමතුම් ලබාගැනීමෙහිලා සහාය අවශ්‍ය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පාරිභෝගිකයන් තෘප්තිමත් කරන පරිදි මෙම කාලපරිච්ජේදය තුල ක්‍රියාකරු සහායක ඇමතුම් ලබාගැනීමේ පහසුකම ඉතා හොදින් ක්‍රියාත්මක කල යුතු බවට ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට උපදෙස් ලබා දී ඇත.

අරුණ අමරසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
**276**,ඇල්විටිගල මාවත,කොළඹ **08**
දුරකථන : **2 689 354**
ෆැක්ස් : **2 689 341**
ඊමේල් : dgtsl@trc.gov.lk

**වැඩිදුර විස්තර සදහා :**

පී.ආර්.අමරසිරි මහත්මිය - නීති කටයුතු පිලිබද අධ්‍යක්ෂිකා
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
දුරකථන : **2 689 350**
ෆැක්ස් : **2 671 647**
ඊමේල් : rene@trc.gov.lk